115

# බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ ක්ෂේත්‍රගත / කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ගණයේ අභ්‍යන්තර විගණන නිලධාරි තනතුර සඳහා වන උසස් කිරීමේ පරිපාටිය

**01.** සම්බන්ධ වන ආයතන

| | | | | |
|---|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව | : | බස්නාහිර පළාත් අභ්‍යන්තර විගණන ඒකකය | |
| | | | යොමු අංකය | : CSO/PTR/15/3/4 |
| | | | දිනය | : 2014-11-25 |
| 1.2 | අමාත්‍යාංශය | : | අදාළ නොවේ | |
| 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම | | | |
| | | | යොමු අංකය | : DMS/D/පොදු - 2 |
| | | | දිනය | : 2012.12.19 |
| 1.4 | ප්‍රධාන ලේකම්(බ.ප)ගේ නිර්දේශය | : | යොමු අංකය | : CSO/PTR/15/3/4 |
| | | | දිනය | : 2014-12-05 |
| 1.5 | වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | | | |
| | | | යොමු අංකය | : |
| | | | දිනය | : |
| 1.6 | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය | | | |
| | | | යොමු අංකය | : 1/4/2/5/32 |
| | | | දිනය | : 2015.03.18 |
| 1.7 | ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය | : | යොමු අංකය | : 1/4/4/280 |
| | | | දිනය | : 2015.05.06 |

**02.** පත්කිරීම් බලධාරියා : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව
ක්‍රියාත්මක වන දිනය : ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

**03.** සේවා ගණය පිළිබඳ විස්තර

| | | | |
|---|---|---|---|
| 3.1 | සේවා ගණය | : | ක්ෂේත්‍රගත / කාර්යාලගත - ඛණ්ඩ 2 |
| 3.2 | ශ්‍රේණි | : | II හා I ශ්‍රේණිවලින් සමන්විත වේ. |
| 3.3 | පැවරෙන කාර්යයන් පිළිබඳ පොදු නිර්වචනය | : | තනතුරට පැවරෙන ප්‍රධාන කාර්යභාරය වශයෙන් කිසියම් පනතක් /ආඥා පනතක් /ප්‍රඥප්තියක් මගින් නිල නාමයෙන් විශේෂිත කොට පවරනු ලබන බලාත්මක කිරීමේ /නියාමනය කිරීමේ / විධිමත් කිරීමේ නෛතික කාර්යයන් විධායක නිලධරයන්ගේ අධීක්ෂණය යටතේ පැවරෙන්නා වූ ද බඳවා ගැනීමේ මූලික සුදුසුකමක් වශයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් අධ්‍යාපන සුදුසුකම් ලෙස අවශ්‍ය වන්නා වූ ද සේවා ගණයකි. |
| 3.4 | කාර්යයන් පැවරීම | : | ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව මත පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැකිය. |

**04.** තනතුරේ ස්වභාවය : ස්ථිර ,විශ්‍රාම වැටුප් සහිත

අනුමත කරමි / නොකරමි
දිනය 6/5/15
කේ.සී. ලෝගේස්වරන්
ආණ්ඩුකාරවර
බස්නාහිර පළාත

114

## 05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : රා.පරි.ච 6/2006 A අනුව MN – 5

5.2 වැටුප් පරිමාණය : 16,720/- 320 X 10 - 365 X 11 - 450 X 15 - 30,685/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| II | පියවර 1 | 16,720/- |
| I | පියවර 12 | 20,285/- |

## 06. සේවා ගණයට අයත් තනතුර /තනතුරු

6.1 අනුමත තනතුරු නාම ,අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| අභ්‍යන්තර විගණන නිලධාරි | II හා I | 25 | බස්නාහිර පළාත් සභාවට අයත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, සභා ලේකම් කාර්යාලය, පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව. ප්‍රධාන ලේකම් කාර්යාලය, සියලුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු, ප්‍රඥප්ති යටතේ පිහිටුවා ඇති මණ්ඩල, අධිකාරි, ආයතන හා අරමුදල් ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි පළාත් සභා කාර්යයන් පවරා ඇති පළාත් සභා නොවන කාර්යාල හා ආයතන සම්බන්ධයෙන් එසේ පවරා ඇති කාර්යයන් පිළිබඳව ද පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමය පිළිබඳ පරීක්ෂා කිරීමත් වැරදි හා වංචා වැලැක්වීමට අවශ්‍ය අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත්බව හෝ ප්‍රමාණවත්බව පිළිබඳව අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගයීමක් පවත්වාගෙන යාම |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : අනුමත තනතුරු 25 න් දැනට සිටින නිලධාරීන් 12 දෙනෙකුට පමණක් පෞද්ගලික වන සේ සකස් කරන උසස් කිරීමේ පරිපාටියක් බැවින් තනතුරු සංඛ්‍යාව 12 සේ සැලකේ.

(ශ්‍රේණිගත උසස් කිරීම් සඳහා II හා I ශ්‍රේණි ඒකාබද්ධ සේවක සංඛ්‍යාවක් සේ සැලකේ)

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :- 14/4/280 දිනය :- 2015.05.06

113

07. බඳවා ගැනීමේ ක්‍රමය : දැනට සිටින නිලධාරීන් 12 දෙනෙකුට පමණක් පෞද්ගලික වන සේ සකස් කරන උසස් කිරීමේ පරිපාටියක් බැවින් අදාළ නොවේ.

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය /වෘත්තීය පරීක්ෂණය /සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට පත් වී වසර තුන (03) ක් ගත වීමට පෙර | දැනට සිටින නිලධාරීන් 12 දෙනෙකුට පමණක් පෞද්ගලික වන සේ සකස් කරන උසස් කිරීමේ පරිපාටියක් වන බැවින් මෙම නිලධාරීන් සියලු දෙනා පෙර බඳවා ගැනීමේ පරිපාටිය යටතේ වූ කඩඉම් පරීක්ෂණය සමත් වී ඇති බැවින් අදාළ නොවේ. |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර පහ ( 05) ක් ගත වීමට පෙර | ලිඛිත (ඇමුණුම 01) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද?

වර්ෂයකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද?

1 වන කාර්යක්ෂමතා කඩඉම - අදාළ නොවේ

2 වන කාර්යක්ෂමතා කඩඉම - බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලය පවරනු ලබන ආයතනයක් මගින්

09. භාෂා ප්‍රවීණතාවය : අදාළ නොවේ.

10. ශ්‍රේණි උසස් කිරීම

10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම : අදාළ නොවේ.

10.2 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 සාමාන්‍ය කාර්යසාධනය අනුව උසස් කිරීම

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : 1/4/4/280 දිනය : 2015.05.06

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

i තනතුරෙහි ස්ථිර කර තිබීම.

ii නිලධර ගණයෙහි II ශ්‍රේණියේ වසර 10 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ එම කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර 10 ක් තුළ සාමාන්‍ය මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. උසස්වීම් දිනට පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වී තිබීම.

10.2.1.2 උසස්කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීමේ බලධරයා විසින් හඳුන්වා දෙනු ලැබූ ආකෘතිය මගින් පත්කිරීමේ බලධරයා වෙත අදාළ නිලධාරියා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉහත සුදුසුකම් සපුරාලන දිනය හෝ II ශ්‍රේණියේ වසර 10 ක සේවා කාලය සම්පූර්ණ කරනු ලබන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීමේ බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.3 I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම : අදාළ නොවේ.

**11. තනතුරුවලට පත්කිරීම : අදාළ නොවේ.**

**12. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද , බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලට ද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝගවලට ද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

**13. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව / බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/280 දිනය : 2015.05.06

**14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය**

මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට විගණන නිලධාරි තනතුරේ මුළු සේවා කාලය වසර 10 ක් සම්පූර්ණ නොවූ පෙර බඳවා ගැනීමේ පරිපාටිය අනුව V ශ්‍රේණියේ සිටින නිලධාරීන් II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට විගණන නිලධාරි තනතුරේ මුළු සේවා කාලය වසර 10 ක් සම්පූර්ණ කර ඇති පෙර බඳවා ගැනීමේ පරිපාටිය අනුව V ශ්‍රේණියේ සිටින නිලධාරීන් I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට විගණන නිලධාරි තනතුරේ මුළු සේවා කාලය වසර 10 ක් සම්පූර්ණ කර ඇති පෙර බඳවා ගැනීමේ පරිපාටිය අනුව IV ශ්‍රේණියේ සිටින නිලධාරීන් I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

<u>සටහන</u>

ඉහත අන්තර්ග්‍රහණ විධිවිධාන යටතේ නිලධාරීන් අදාළ ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

මෙම පරිපාටිය යටතේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සේවා කාලයක් නොමැති ව II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ නිලධාරීන් පෙර බඳවා ගැනීමේ පරිපාටිය යටතේ V ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර තිබේ නම්, නව පරිපාටිය යටතේ වන II ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් වූවා සේ සැලකේ.

අන්තර්ග්‍රහණය කිරීම ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට අනුව සිදු කරනු ලබන අතර, අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ නිලධාරීන්ගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවන අතර, වැටුප් පරිවර්තනයේ දී අදාළ නිලධාරියා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තිබීමද සිදු නොකළ යුතුය.

**15. මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.**

**අර්ථ නිරූපණ**

<u>සතුටුදායක සේවා කාලය</u>

(i) පළාත් සභා රාජ්‍ය සේවයේ සේවකයකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මගින් ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම මගින් ද, සිදු කළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

(ii) නිලධාරියා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා, අඩු කොට, නතර කොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එය ද, ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/229 දිනය : 2015.05.06

110

හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර 03ක කාලයක් ද සහ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.

<u>සක්‍රිය සේවා කාලය</u>

සක්‍රිය සේවා කාලය යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයෙන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

<u>නියමිත දිනට</u>

අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු දිනය, "නියමිත දිනය" ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස්වීම්වලදි නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්වන නිලධාරීන්ට බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි උසස්වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයකට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

සකස් කළේ: අත්සන ....................

පරීක්ෂා කළේ : ....................
(විෂයභාර මාණ්ඩලික නිලධාරියා)

එස්. එම්. එච්. කුසුම්සිරි
පරිපාලන නිලධාරී (ආයතන හා පුහුණු)
ප්‍රධාන ලේකම් කාර්යාලය
බස්නාහිර පළාත් සභාව

නිර්දේශ කර ඉදිරිපත් කරමි

දිනය 2010 / 11 / 25

අත්සන ....................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)

නම

තනතුර

නිලමුද්‍රාව

එම්.පී.කේ. කතිරආරච්චි
අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව,
බස්නාහිර පළාත් සභාව.

යොමු අංකය : CSO/PTR/15/3/4

බස්නාහිර රාජ්‍ය සේවයේ පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ දැනට සේවයේ නියුතු අභ්‍යන්තර විගණන නිලධාරීන් සඳහා යෝජිත මෙම උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය 2014 - 12 - 05

අත්සන : ....................

නම : ....................

ප්‍රධාන ලේකම් (බ.ප)

නිලමුද්‍රාව

ජේ. එම්. සී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය 1/4/4/280 දිනය 2015.05.06

109

යොමු අංකය: 1/4/2/5/32

බස්නාහිර රාජ්‍ය සේවයේ පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ දැනට සේවයේ නියුතු අභ්‍යන්තර විගණන නිලධාරීන් සඳහා යෝජිත මෙම උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය 2015.03.18

අත්සන : ..........................................

නම : ..........................................

ලේකම්

පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

නිලමුද්‍රාව

වී. රාජපක්ෂ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

යොමු අංකය: 1/4/4/280

බස්නාහිර රාජ්‍ය සේවයේ පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ දැනට සේවයේ නියුතු අභ්‍යන්තර විගණන නිලධාරීන් සඳහා යෝජිත උසස් කිරීමේ පරිපාටිය 2015.05.06 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

දිනය 2015.05.06

අත්සන : ..........................................

නම : ..........................................

ආණ්ඩුකාර ලේකම්

නිලමුද්‍රාව

සුනිල් අබේවර්ධන
ආ. ප. ආණ්ඩු...

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : 1/4/4/280 දිනය 2015.05.06

108

ඇමුණුම : 01

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ ක්ෂේත්‍රගත / කාර්යාලගත - බණ්ඩ 2 සේවා ගණයේ අභ්‍යන්තර විගණන නිලධාරි තනතුර සඳහා වන 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පිළිබඳ විස්තර

1. විභාගයේ පරීක්ෂණයේ නම : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ ක්ෂේත්‍රගත / කාර්යාලගත - බණ්ඩ 2 සේවා ගණයේ අභ්‍යන්තර විගණන නිලධාරි තනතුර සඳහා වන 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| කළමනාකරණ ගණකාධිකරණය | පැය 03 | 100 | 40 |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | පැය 03 | 100 | 40 |

3. පවත්වනු ලබන බලධාරියා : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලය පවරන ලද ආයතනයක් විසින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කළමනාකරණ ගණකාධිකරණය | අයවැය ලේඛන සම්පාදනය කිරීමේ සංකල්ප, අයවැය පාලනය, ප්‍රධාන හා අතුරු අයවැය, අයවැය කළමනාකරණයෙහි ලා කළමනාකරණ සහභාගීත්වය මැදිහත්වීම සහ අභිප්‍රේරණය, අයවැය කාලසීමාව සහ ප්‍රධාන අයවැය සාධක හඳුනා ගැනීම |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | රාජ්‍ය මූල්‍ය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ නෛතික රාමුව, ආයතනික රාමුව, පාර්ලිමේන්තුවේ පාලනය, මහා භාණ්ඩාගාරයේ කාර්යයන්, ආදායම් හා වියදම් ඇස්තමේන්තු, විගණකාධිපති, රාජ්‍ය ගිණුම් කාරක සභාව, ඒකාබද්ධ අරමුදල |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :1/4/4/280 දිනය :2015.05.06

අත්සන ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)
නම ...... එම්. පියසිලි පතිරණ ......
තනතුර ...... අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන), අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව, බස්නාහිර පළාත් සභාව. ......
දිනය ..............................
නිලමුද්‍රාව ..............................